M13/1/AXSIN/SP2/SIN/TZ0/XX

22130180

International Baccalaureate®
Baccalauréat International
Bachillerato Internacional

**SINHALESE A: LITERATURE – STANDARD LEVEL – PAPER 2**
**SINGHALAIS A : LITTÉRATURE – NIVEAU MOYEN – ÉPREUVE 2**
**SINGALÉS A: LITERATURA – NIVEL MEDIO – PRUEBA 2**

Monday 13 May 2013 (morning)
Lundi 13 mai 2013 (matin)
Lunes 13 de mayo de 2013 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the Part 3 works you have studied and compare and contrast these works in response to the question. Answers which are not based on a discussion of at least two Part 3 works will not score high marks.
- You are not permitted to bring copies of the works you have studied into the examination room.
- The maximum mark for this examination paper is *[25 marks]*.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Traitez un seul sujet de composition. En basant votre réponse sur au moins deux des œuvres de la troisième partie que vous avez étudiées, vous devez comparer et opposer ces œuvres dans le cadre du sujet. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la troisième partie n'obtiendront pas une note élevée.
- Vous n'êtes pas autorisé(e) à amener des exemplaires des œuvres que vous avez étudiées dans la salle d'examen.
- Le nombre maximum de points pour cette épreuve d'examen est *[25 points]*.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Conteste una sola pregunta de redacción. Base su respuesta en al menos dos de las obras estudiadas de la Parte 3, comparándolas y contrastándolas en relación con la pregunta. Las respuestas que no se basen en al menos dos obras de la Parte 3 no recibirán una puntuación alta.
- No se permite traer a la sala de examen copias de las obras estudiadas.
- La puntuación máxima para esta prueba de examen es *[25 puntos]*.


© International Baccalaureate Organization 2013

https://xtremepape.rs/

පහත සඳහන් ප්‍රශ්න අතුරින් **එක් ප්‍රශ්නයකට** පමණක් පිළිතුරු සපයන්න. **3** වන කොටසේදී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් **පිරිසෙයින් දෙකක් වත්** ඔබේ පිළිතුරට පදනම් විය යුතු වන අතර ප්‍රශ්නයට අදාළ වන සේ එම කෘති **සන්සන්දනාත්මකව විමර්ශනය කළ යුතුය. 3** වන කොටසෙන් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොටගෙන **නොමැති** පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් **නොලැබෙනු** ඇත.

**සම්භාව්‍ය සාහිත්‍යය**

**1.** පැරණි ලේඛකයන් සිය නිර්මාණවලට පාඨක අවධානය යොමු කරගැනීම සඳහා කොතෙක් දුරට විවිධාකාර හා විචිත්‍ර වූ වර්ණනා යොදාගෙන ඇද්ද? ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරෙන් විමසන්න.

**2.** "මිථ්‍යා කථා හෝ 'මිථ්‍යාව' පැරණි සිංහල සාහිත්‍ය කෘතීන්හි බහුලව යොදාගෙන ඇත." ඔබ හදාරා ඇති සාහිත්‍ය කෘති දෙකක් පාදක කරගනිමින් මෙම කියමන විමර්ශනය කරන්න.

**3.** "සාම්ප්‍රදායික කථා වස්තු ඇසුරු කරගනිමින් කෘති රචනයට සම්භාව්‍ය සාහිත්‍ය කරුවන් යොමු වී ඇතත් එම කතුවරුන් භාවිත කර ඇති සාහිත්‍යමය උපක්‍රම හේතු කොටගෙන ඒවා කවර යුගයක හෝ පාඨකයන්ට අදාළ වන සේ ඉදිරිපත් කිරීමට ඔවුන් සමත් වී ඇත." ඔබ හදාරා ඇති කෘති දෙකක් ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

**නාට්‍යය**

**4.** "නාට්‍යයකින් අපේක්ෂිත නිර්මාණාත්මක ගුණය ඉස්මතු වීමට නම් එහි ඇතුළත් වන සියලු චරිත නාට්‍යයේ අන්තර්ගතය උද්දීපනය වන සේ රට දායක විය යුතුය." ඔබ හදාරා ඇති නාට්‍ය කෘති දෙකක් ආශ්‍රය කරගනිමින් මෙම කියමන පහදන්න.

**5.** ඔබ හදාරා ඇති නාට්‍ය දෙකක් නිර්මාණ කරුවන් එම කෘතීන්හි ශෝකය දනවන හැඟීම් ඉස්මතු කිරීම සඳහා නාට්‍ය උපක්‍රම භාවිත කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

**6.** මිනිසා තුළ පවත්නා දුර්ගුණ අවම කර ලීම සඳහා නාට්‍ය කරුවන් උපහාසය කොතරම් ප්‍රබලව යොදා ගෙන ඇද්දැයි ඔබ හදාරා ඇති නාට්‍ය කෘති දෙකක් පාදක කරගනිමින් විමසන්න.



https://xtremepape.rs/

**නවකථාව**

**7.** ඔබ හදෑරූ නවකථා දෙකක් පාදක කරගනිමින්, එම කතුවරුන් සිය කෘතීන්හි ප්‍රධාන චරිත කොතරම් දුරට මානව දයාවෙන් යුතුව නිරූපණය කර ඇද්දැයි විමසන්න.

**8.** "නවකථාවක දක්නට ලැබෙන සාහිත්‍යමය ලක්ෂණ අතර මනඃකල්පිතය පොදු ලක්ෂණයක් වෙයි." ඔබ හදෑරූ කෘතීන් දෙකක් කතුවරුන් සිය නිර්මාණයන්හි එම ලක්ෂණය යොදාගෙන ඇති ආකාරය විමර්ශනය කරන්න.

**9.** ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරු කරගනිමින් ඒවායේ ආඛ්‍යානයේදී යොදාගෙන ඇති විශේෂ ලක්ෂණ සාකච්ජා කරන්න.

**නූතන පද්‍ය**

**10.** ඔබ හදාරා ඇති කවියන් දෙදෙනකුගේ නිර්මාණවල දක්නට ලැබෙන විශේෂ කාව්‍යමය ලක්ෂණ පැහැදිලි කරන්න.

**11.** "ගද්‍ය රචකයකුට වඩා පද්‍ය රචකයකු සිය කෘතීන්හිදී කාව්‍යමය වාග් ව්‍යවහාරය ගළ පා ගන්නා ආකාරය අනුව රසිකයා තුළ සංවේදී බවක් නිර්මාණය කිරීමට සමත් වෙයි." ඔබ හදාරා ඇති නිර්මාණ දෙකක් ඇසුරෙන් මේ පිළිබඳ අදහස් දක්වන්න.

**12.** නූතන පද්‍ය නිර්මාණ මගින් සානුකම්පිත හැඟීම් දැනවීම කොතෙක් දුරට සාර්ථක ලෙස සිදු වී ඇද්දැයි ඔබ හදාරා ඇති කාව්‍ය නිර්මාණ දෙකක් ආශ්‍රයෙන් විමසන්න.

**කෙටිකතාව**

**13.** "කෙටිකතාවක විශේෂ ලක්ෂණයක් වන කෙටි බව හේතු කොටගෙන එහි සීමාවන් ඇති වන නමුදු දක්ෂ ලේඛකයකුට එය අවාසි සහගත නොවනු ඇත." ඔබ හදාරා ඇති කෙටිකතා කරුවන් දෙදෙනකුගේ නිර්මාණ ඇසුරෙන් සාකච්ජා කරන්න.

**14.** "කෙටිකතාව, උපාඛ්‍යානයකට (ඇනෙක්ඩෝට්) වඩා වෙනස් වූවකි." ඔබ හදාරා ඇති කෘතී දෙකක් පාදක කරගනිමින් මෙම කියමන පහදන්න.

**15.** "හුදු ආඛ්‍යානයකදී මෙන් නොව කෙටිකතාවකදී එහි අන්තර්ගත චරිතවල හැසිරීම, සිතුවිලි හා අන්තර්ක්‍රියාවන් කථා වස්තුව කලාත්මක ලෙස ගොඩනැගීමට උපකාරී වන සේ යොදාගත යුතුය." ඔබ හදාරා ඇති කෙටිකතා දෙකක් ඇසුරෙන් විමසන්න.



https://xtremepape.rs/